---

කරච්චි ප්‍රාදේශිය සභාව

කිලිනොච්චි දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013  මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර  සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ඔක්තෝබර් 03 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කරච්චි ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කරච්චි ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිළබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින්  පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

වත්කම් හා වියදම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල නිරික්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත දැක්වේ.

| | වත්කම් | | වියදම් | |
|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | රු. | රු. | | රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 3,532,315 | - | - |
| වැඩියෙන් දැක්වීම් | 01 | 13,050 | 01 | 172,367 |

1.3.2 වටිනාකම් සඳහන් නොකරන ලද පරිත්‍යාග කළ වාහන

සමාලෝචිත වර්ෂයේ සභාව සතු වාහන 18 ක් අවසන් ගිණුම් වල පෙන්වා නොමැත. පරිත්‍යාග වශයෙන් ලැබූ මෙම වාහන වල වටිනාකම් ගණනය කර නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 11,081,595 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 40,403,697 ක් විය.

2.2 අයවැය පාලනය

අයවැයගත හා සත්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය පාලන ඒකකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 10 | - | - |
| (ii) | බදු කුලී | 22,843 | 18,745 | 508 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,805 | 2,941 | - |
| (iv) | වෙනත් ආදායම් | 52,421 | 40,250 | 7,983 |

2.3.2 හිඟ කුලී

සමාලෝචිත වර්ෂයේ පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා කඩ කුලී වශයෙන් රු.507,638 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

2.3.3 උසාවි දඩ

සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ වශයෙන් සභාවට ලැබිය යුතු රු.4,814,733 ලබා ගැනීමට ප්‍රමාණවත් කටයුතු කර නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

(අ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු පිළිබඳ ලැයිස්තුවක් රෙජිස්ට්‍රාර් ජනරාල්ගෙන් ලබාගෙන නොතිබුණි.

(ආ) 2010 සහ 2011 වර්ෂයන්ට අදාල රු.3,532,315 ක මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

| වර්ෂය | ලැබිය යුතු මුදල (රු) |
|---|---|
| 2010 | 1,059,550 |
| 2011 | 2,472,765 |
| | 3,532,315 |

2.4 අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (i) | 1989 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| | <u>පරිච්ඡේදය III</u><br>වගන්තිය 76 | රු.60,833 ක් වූ කුලිය අයකරගැනීම පිළිබඳ ප්‍රමාදය ආදායම එකතු කරන ලිපිකරු විසින් සභාවේ සාභාපතිවරයා හෝ ලේකම්වරයා වෙත දක්වා නොතිබුණි. |
| | වගන්තිය 81 | සෑම කාර්තුවක් අවසානයේදිම එකතු කළ යුතු උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු පිළිබඳ කටයුතු කර නොතිබුණි. |
| (ii) | 2011.09.09 දිනැති අංක 1722/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ උප වගන්තිය 11 | සභාව සතු වාහන වලට බලපත්‍ර ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | සභාව සතු වාහන වල ඉන්ධන දහනය පිළිබඳ පරික්ෂා කර නොතිබුණි. |
| (iv) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි | |

| | |
|---|---|
| ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 වගන්තිය 2.14.1 | රු.100,000 ඉක්මවන භාණ්ඩ හා සේවා වෙනුවෙන් අවම වශයෙන් මිළ ගණන් 5 ක් ලබා ගත යුතුය. කෙසේවෙතත්, රු.270,000 වටිනා ලීබඩු මිලදී ගැනීමේදි එසේ කටයුතු කර නොතිබුණි. |

2.5 ආදායම් එකතු නොකිරීම

2.5.1 දුරකථන කුළුණු පිළිබඳ ගාස්තු

අදාල ගාස්තු 2009.04.17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි සභා ප්‍රදේශයේ තිබෙන දුරකථන කුළුණු 7 කට අයකර නොතිබුණි.

2.6 වත්කම් කළමනාකරණය

2.6.1 උපයෝජිත නොවු භෞතික සම්පත්

(අ) ජයන්ති නගරයේ පිහිටි රු.250,000 වටිනා මස් කඩය බඳුදීම පිළිබඳ සභාව විසින් කටයුතු කර නොමැති හෙයින් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි.

(ආ) රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පරිත්‍යාග කරන ලද SOLAR ENERGY යන්ත්‍ර 02 ක් වර්ෂ 3 කට අධික කාලයක් නිෂ්කාර්යව තිබෙන බව විගණනයේදි අනාවරණය විය.

2.7 ලැබිය යුතු ගිණුම්

මෙම වාර්තාවේ දින දක්වා රු.25,433 ක ආදායම් ණයගැතියන් අයකර නැත.

2.8 කොන්ත්‍රාත් පරිපාලනය

2.8.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ ප්‍රමාද

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරිමට බලාපොරොත්තු වූ රු.8,535,681 වටිනා ව්‍යාපෘති 03 ක් මෙම වාර්තාවේ දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ආදායම් එකතු කිරිම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) පිරිස්
(ඉ) පරිත්‍යාග
(ඊ) විවිධ තැන්පත්
(උ) අයවැය
(ඌ) ගබඩාව